

# 'කුරුළු උණ' තවත් වසංගතයක් වෙයි ද?

ආචාර්ය විද්‍යානි මනතුංග

***1918-19 කාලය තුලදී සති 16ක් වැනි කෙටි කාල සීමාවක් ඇතුලත මිලියන 21කට ආසන්න ජීවිත සංඛ්‍යාවක් නැති කල ස්පැනිෂ් ෆ්ලූ පතුරවනු ලැබුවේ ඉන්ෆ්ලුවන්සා 'ඒ' වෛරස් කාණ්ඩයේ එච්1 එන්1 උප කාණ්ඩය මගිනි. 1957-58 දී ඒෂියන් ෆ්ලූ නිසා මිලියනයකට ආසන්න ජීවිත සංඛ්‍යාවකුත්, 1968-69 දී හොංකොං ෆ්ලූ නිසා තවත් මිලියනයකට ආසන්න ජීවිත සංඛ්‍යාවකුත්, නැතිකර දැමීමට මුල්වූයේ පිළිවෙලින් එච්2 එන්2 සහ එච්3 එන්2 යන ඉන්ෆ්ලුවන්සා 'ඒ' වෛරස් කාණ්ඩයේ උප කාණ්ඩ දෙකකි.***

**වසංගත** උණ (ෆ්ලූ) පිළිබඳව වන අතීත වාර්තා කියාපාන්නේ ශත වර්ෂයක් ඇතුලත ලෝකය තෙවරක්ම වසංගත තත්වයන්ට මුහුණ දුන් බවයි. ඉන් අවසාන වසංගත අවස්ථාව 1968 තෙක් පැරණිවී ඇති අතර, නූතන ලෝකය, ඉතිහාසයේ සිව්වන වසංගතයටත්, අලුත් ශතවර්ෂයක පළමු වසංගතයටත් ගොදුරු විය හැකිද යන සැකය අද වනවිට අලුත් වෙමින් පවතී. නමුත් පැහැදිලි සත්‍යය නම් එය එසේ සිදුවෙනවාමද? හෝ නොවනවාද? එසේ සිදුවනවා නම් එහි කාලසීමාව හා එයින් ඇතිවන බලපෑමේ බරපතලකම කොතරම්ද? යන්න නිශ්චය කිරීමට කිසිවෙකුටත් නොහැකිවීමයි.

පෙරදී ඇතිවූ ෆ්ලූ වසංගතයන්ගේ දත්ත අනුව නූතන ලෝකය වසංගතයකට මුහුණාපෑවහොත් මුළු ජනගහනයෙන් 25-35% ඊට නතු විය හැකි බවත්, ඉහළ මට්ට-මෙන් පැවතියහැකි සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම යටතේ වුවද, මිලියන 2-7 දක්වා මරණ සංඛ්‍යාවක් අපේක්ෂා කල හැකි බවත්, ලෝක සෞඛ්‍ය සංවිධානය මේවනවිට අනාවැකි පලකර තිබේ.

කෙසේ වෙතත් මෑත වසර කිහිපය ඇතුලතදී සාමාන්‍ය ජනතාවගේ අවධානය වරෙක වඩාත් ඉස්මතුකරගනිමින්ද, තවත්වරෙක ඇල්මැරෙමින්ද පවතින මාතෘකාවක් බවට පත්වී ඇති මෙම වසංගත උණ (ෆ්ලූ) පිළිබඳව විස්තරාත්මක තොරතුරු සො-යාබැලීම කාලීන අවශ්‍යතාවයක් බව පැහැදිලිය.

ෆ්ලූ යන කෙටි නමින් හැඳින්වෙන ඉන්ෆ්ලුවන්සා රෝගය ඇතිකරන්නේ ඉන්ෆ්ලුවන්සා 'ඒ, බී, සහ සී' ලෙසට දක්වන වෛරස් කාණ්ඩ තුනෙන් එකක් මගිනි. මින් 'සී' වෛරස් කාණ්ඩය සතුන් මත පමණකුත්, 'බී' වෛරස් කාණ්ඩය මිනිසුන් මත පමණකුත් ගුණනය වෙමින් රෝගය ඇතිකරන අතර 'ඒ' වෛරස් කාණ්ඩයට පමණක් මිනිසුන් සහ අනිකුත් සතුන් අතරත් (කුකුළන්, තාරාවන්, ඌරන්, තල්මසුන්, අශ්වයන්, සහ සීල් මත්සයන් වැනි සතුන්) ගුණනයවෙමින් රෝගය ඇතිකිරීමේ හැකියාව පවතී. එපමණක්ද නොව ඉන්ෆ්ලුවන්සා 'ඒ' වෛරස් කාණ්ඩයේ සියලුම උප කාණ්ඩ කුරුළු වල්-දර්ශ තුල හඳුනාගෙන තිබේ.

ඉන්ෆ්ලුවන්සා 'ඒ' කාණ්ඩයේ වෛරස පමණක් එය මතුපිට පවතින ප්‍රෝටීන වර්ග 2ක් වන හීමග්ලූටනින් (එච්) සහ නියුරමිනි-ඩේස් (එන්) වල ව්‍යුහය අනුව පිළිවෙලින් උප කාණ්ඩ 16කට, සහ උප කාණ්ඩ 9 කට නැවත වරක් බෙදයි. මෙම 'එච්' සහ 'එන්' යන උප කාණ්ඩ වර්ග දෙකේම කුමනහෝ එකතුවකින් 'ඒ' කාණ්ඩයේ එක වෛරසයක් නිර්නයකරයි. එයිනුත් 'එච්' යන උප කාණ්ඩයේ එච් 5 සහ එච් 7 යන දෙක නිතරම වාගේ රෝග ආසාදන හැකියාව අතින් වඩාත් ඉහල කාණ්ඩ දෙකක් හැටියට වාර්තාවේ. වසංගත උණත්, ෆ්ලූ වෛරස් කාණ්ඩ හඳුනාගැනීමත් අතර ඇති ප්‍රධාන ලක්ෂණය නම් ලෝකයේ පැතිරගිය සෑම වසංගත උණක්ම ඇතිකරනු ලැබුවේ ඉන්ෆ්ලුවන්සා 'ඒ' කාණ්ඩයේ වෛරසයක් මගින් වීමයි.

මෑතක ප්‍රබල ලෙස කතාබහට ලක්ව ඇති 'කුරුළු උණ' ඒ නමින්ම හැඳින්වෙන පරිදි මිනිසාට නොව පක්ෂීන්ට වැළඳෙන රෝගයකි. මෙම රෝගය පතුරවනු ලබන වෛරසය ෆ්ලූ වෛරසයන්ගේ 'ඒ' කාණ්ඩයට අයත් 'එච් 5 එන් 1' යන උප කාණ්ඩයට අයත්වේ. මෙම කුරුළු උණ රෝගය 'එච් 5 එන් 1' යන වෛරස් කාණ්ඩයේ නමත් සමඟ ආඳා කතාකිරීම එයට මිනස් ප්‍රජාව වෙත තවත් ෆ්ලූ වසංගතයක් ඇතිකිරීම සඳහා ඇති සුදුසුකම යම් තරමක් දුරට හෙලිදරව්කිරීමක් බව ඉහත දක්වනලද විස්තරකිරීමත්, පහතින් පෙන්නුම් කෙරෙන ලෝකයේ පැතිරී ඇති වසංගත උණ පිළිබඳව ඇති අතීත වාර්තාත් පෙන්නුම් කරනු ඇත.

1918-19 කාලය තුලදී සති 16ක් වැනි කෙටි කාල සීමාවක් ඇතුලත මිලියන 21කට ආසන්න ජීවිත සංඛ්‍යාවක් නැති කල ස්පැනිෂ් ෆ්ලූ පතුරවනු ලැබුවේ ඉන්ෆ්ලුවන්සා 'ඒ' වෛරස් කාණ්ඩයේ එච්1 එන්1 උප කාණ්ඩය මගිනි. 1957-58 දී ඒෂියන් ෆ්ලූ නිසා මිලියනයකට ආසන්න ජීවිත සංඛ්‍යාවකුත්, 1968-69 දී හොංකොං ෆ්ලූ නිසා තවත් මිලියනයකට ආසන්න ජීවිත සංඛ්‍යාවකුත්, නැතිකර දැමීමට මුල්වූයේ පිළිවෙලින් එච්2 එන්2 සහ එච්3 එන්2 යන ඉන්ෆ්ලුවන්සා 'ඒ' වෛරස් කාණ්ඩයේ උප කාණ්ඩ දෙකකි.

ඉතින් මේ තත්වයන් නිසාම මිනිසාට භියජනක හෙටදිනකට මඟ පාදමින්, ලෝකයපුරා අද දින මන්දගාමී ස්වරූපයකින් පැතිරෙමින් පවතින 'කුරුළු උණ' ලෝක ප්‍රජාව වෙත තවත් ෆ්ලූ වසංගතයක් කැන්දා ඒම සඳහා මූලිකම අඩිතාලම සකස්කරමින් පවතීය යන්න බලධාරීන්ගේ මතය වී තිබේ. පක්ෂීන්ට පමණක් සීමාවී තිබූ මෙම මාරක කුරුළු උණ රෝගය 1997 දී මිනිසුන් අතරට පළමුවරට පැමිනෙමින්, හොංකොං රටෙන් මිනිස් ජීවිත 6ක් බිලිගැනීමත් සමඟ අලුත් ඉන්ෆ්ලුවන්සා වසංගතයක යෝධ සෙවනැල්ලක් මිනිස් වර්ගයා මතට මෑත ඉතිහාසයේ පළමුවරට පතිත විය. ඒ අභියෝගයට හොංකොං රටට මුහුණ දීමට සිදුවූයේ මිලියන 1.5 ක් කුකුළන් විනාශකර දැමීමෙනි. එසේ කිරීමට සිදුවූයේ කුරුළු උණ රෝගයට ගොදුරු-වුන කුරුල්ලා/ලන් සිටි ස්ථානයේ සිට කිලෝමීටර තුනක් ඇතුලත සිටින සියලුම කුරුල්ලන් විනාශ කිරීම රෝග පාලනයට අත්‍යාවශ කරුණක් බැවිනි.

1997න් පසු මහත් ආන්දෝලනයකට ලක්වෙමින් නැවත වරක් 2003 දී වියට්න-ාමයෙන් ජීවිත 3ක් බිලිගනිමින් පැනනැගුනු මෙම කුරුළු උණ රෝගය 2004 වසර අවසානය වනවිට වියට්න-ාමයෙන් සහ තායිලන්තයෙන් තවත් මිනිස් ජීවිත 32ක්ම ගොදුරුකරගනු ලැබීය. 2005 වසර අවසානයේදී නැවතත් තවත් මිනිස් ජීවිත 41 (වියට්නාමය, තායිලන්තය, ඉන්දුනීසියාව, චීනය සහ කාම්බෝජය) බිලිගැනීමට තරම් කුරිරුවූ මෙය, 2006 වසර ඇතුලතදී මේ වන විට පමණක් ගොදුරුකරගත් ජීවිත ගණන 37කි (තුර්කිය, ඉරාකය, ඊජිප්තුව, අසර්බයිජානය, ඉන්දුනීසියාව, චීනය සහ කාම්බෝජය). ලෝකයේ මේ වනවිට කුරුළු උණ රෝගට ගොදුරුවී ඇති මිනිසුන් මුළු සංඛ්‍යාව 204ක් වන අතර සිදුවී ඇති මරණ ප්‍රමාණය 123ක් ලෙසට වාර්තාගතය. කෙසේවුවද මෙම වෛරසයට එකම ආකාරයට නිරාවරණයවුනු මිනිසුන් අතරින් සමහරක් මිනිසු-න් පමණක් රෝගයට ගොදුරුවීම තවමත් තේරුම් නොගත් කරුණක් වී ඇත.
මේ සම්භන්ධයෙන් සංචාරක කුරුල්ලන් කෙරෙහි ප්‍රධාන අවදානයක් යොමුකිරීමට සිදුව ඇත්තේ ලෝකය පුරා කුරුළු උණ පැතිරීයාම වැලැක්වීමට ඇති ප්‍රධානම බාදාව ඔවුන් බැවිනි. සංචාරක කුරුල්ලන් රටවල් අතර රෝග වාහකයන් ලෙසට ක්‍රියාකල හැකිය. ඒ පිළිබඳව ඇති වඩාත් කණගාටු දායක තත්වය නම් ආස-ාදිත කුරුල්ලන් සියලුදෙනාගෙන්ම කුරුළු උණ රෝග ලක්ෂණ පහළනොවීමයි. ඒ නිසාම රෝගය වැළඳුනු සංචාරක කුරුල්ලෙකු හට කිලෝ මීටර දහස්ගණනක් පියඹා වෙනත් රටකට රෝගය සමඟ යා හැකිය. අද වන විට එය ආසියාව, මැද පෙරදිග, යුරෝපය සහ අප්‍රිකාව දක්වාම පැතිර ගොස් ඇති අතරම, කුරුල්ලන් පමණක් නොව, ඌරන්, බළලුන් වැනි ගෘහාස්ථික ක්ෂීරපායි සතුන් අතරද මේ වනවිට රෝගය හඳුනාගෙනතිබේ.

මේ සියල්ල අතරින් වඩාත්ම වැදගත් ලෙසට දැක්විය හැක්කේ පහත දැක්වෙන කරුණයි. එනම් ෆ්ලූ වසංගතයක් ඇතිවීම සඳහා සම්පූර්ණ කලයුතු කාරණා තුනෙන් දෙකක්ම මේ වනවිටත් 'කුරුළු උණ' විසින් සංතෘප්ත කරතිබීමයි. වසංගත තත්වයක් ඇතිවීම සඳහා සංතෘප්ත වියයුතු මූලික කාරණා තුනනම්:

(1) අලුත් ඉන්ෆ්ලුවන්සා (ෆ්ලූ) වෛරසයක් මතුවීම,
(2) ඒ නිසා මිනිසුන් තදබල ලෙස රෝගාතුරවීම,
(3) එම අලුත් ෆ්ලූ වෛරසය ලෙහෙසියෙනුත්, පරිසර වෙනස්කම් වලට ඔරොත්තු දෙන අයුරිනුත්, මිනිසුන් අතර පැතිරයාමට පටන්ගැනීම.

එක් මිනිසකුගෙන් තවත් මිනිසකුට ආසාදනය පැතිරවීම සඳහා වෛරසය වෙත තිබියයුතු හැකියාව මේ වනතෙක් එය ලබානොතිබීම (තවමත් වෛරසය පැතිරෙන්නේ කුරුල්ලකුගෙන් කුරුල්ලෙකුට හෝ කුරුල්ලකුගෙන් මිනිසෙකුට පමණි) සාමාන්‍ය ජනතාවට සහනයකුත්, ක්ෂේත්‍රයේ පරිණතයන්ට අභියෝගයකුත් වනවාට සැක නැත.

මෙම රෝගයේ අවිනිශ්චිත හෙට දවසට අවාසනාවන්ත විනිශ්චයක් ලබාදීමට, එනම් එක මිනිසකුගෙන් තවත් මිනිසකුට රෝගය බෝකලහැකි තත්වයට වෛරසයට පත්වීමට ඉඩ ඇති ක්‍රම දෙකකි. එක් ආකාරයක් නම් 'කුරුළු උණ' රෝගයට ගොදුරුවූ මිනිසකු තුල ඇති ජාන කෙටසක් වෛරසය සමඟ මිශ්‍ර/හුවමාරු වීම නිසා වසංගත වර්ගයේ ජාන ව්‍යුහයකින් යුතු වෛරසයක් බවට පත්වීම. මෙම ආකාරයේ වෙනස් කමක් අනතුරු ඇඟවීමක් නොමැතිව ඉතාම හදිසියෙන් පැණනැගිය හැකි ය.

අනිත් ආකාරය නම් වෛරසය තුලම ස්වභාවිකව ඇතිවීමට ඉඩඇති එහි ව්‍යුහයේ අසාමාන්‍ය වෙනස්වීමක් මගින් මිනිස් සෛලය සමඟ සම්භන්ධවීමට හැකියාවක් ඇතිකර ගැනීමයි. දිනෙන් දින වැඩිවෙන මිනිස් ආසාදන ගණන මෙලෙස වෛරසය තුල ස්වභාවිකව ඇතිවීමට ඉඩඇති ක්‍රියාකාරී ව්‍යුහයේ වෙනස්කමකට ඉඩදීම සඳහා වන අවදානම බිඳෙන් බිඳ වර්ධනයකරයි. කොයි ආකාරයකින් හෝ අවශ්‍ය වෙනස්කම් සකස්කරගත් මේ කුරුළු උණ වෛරසයට මිනිස් ප්‍රජාව ගොදුරුවුවහොත් ඊට මුහුණදීමට හැකිවන අයුරින් ප්‍රතිදේහ ශරීරය තුල නිපදවීට ඇති හැකියාව මිනිස් වර්ගයාතුල නොමැත. ඊට හේතුව නම් අපේ ශරීරය තුල රෝගයකට විරුද්ධව ප්‍රතිදේහ නිපදවීමට ඇති වසා පද්ධතියට මෙම වෛරසට මීට පෙර මුණ ගැසී නැතිකමයි (රෝගයට ගොදුරුවී සුවපත්වී ඇත්තන් මෙම තර්කයෙන් පිටස්තරයි). එවැනි අවස්ථාවක් මිනිස් ප්‍රජාව ෆ්ලූ වසංගත තත්වයකට ගොදුරුවූ අවස්ථාවක් ලෙසට හැඳින්විය හැකි ය.

කුරුළු උණ වෛරසයේ මිනිස් ආසාදනයකදී මතුවන රෝග ලක්ෂණ සාමාන්‍ය ප්‍රතිශ්‍යා උණකදී මෙන්වීම ඒ පිළිබඳ අවදානම් තත්වය වඩාත් බරපතල කරයි. නමුත් රෝග කාරකය ශරීරයට ඇතුළුවී දින 5-7 අතරදී මරණීය තර්ජන රෝගියා තුල ඇතිකරලීමට තරම් බලවත් බව